# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
# பதிவாளர் நாயகம் திணைக்களம்
# REGISTRAR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. RG/AB/13/01/EB(II වෙළුම)

තැ.පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. 565

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.
234/A3, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2026.07.31


සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්
ප්‍රධාන කාර්යාලයේ සියලුම අංශ ප්‍රධානීන්
සියලුම කලාප භාර නියෝජ්‍ය /සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්
සියලුම දිස්ත්‍රික් භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්
සියලුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන්

<u>ලේඛන සහකාර සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පලමු වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය – 2026</u>

2012.07.26 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ලේඛන සහකාර තනතුරෙහි බඳවා ගැනීම් පරිපාටියේ 8.1 උප වගන්තියේ සඳහන් ඇමුණුම 02 ප්‍රකාරව, ලේඛන සහකාර III ශ්‍රේණියේ නිලධාරීන් විසින් සමත්විය යුතු පලමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පැවැත්වීමට තීරණය කර ඇත.

02. එබැවින්, පලමු කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණය සම්පූර්ණ නොකරන ලද ඔබ කාර්යාලයේ සේවයෙහි නියුතු ලේඛන සහකාර III ශ්‍රේණියේ නිලධාරීන් මේ සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙස කාරුණිකව දන්වමි. බඳවා ගැනීමේ පරිපාටිය අනුව පලමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය පහත පරිදි ලිඛිත ප්‍රශ්න පත්‍රයකින් හා ප්‍රායෝගික පරීක්ෂණයකින් සමන්විත වේ. මෙම පරීක්ෂණයට අදාල විෂය නිර්දේශය ඇමුණුම 01 මගින් දක්වා ඇත.

I. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තු නියෝග හා රෙගුලාසි (කාලය - පැය 01)
II. පරිගණක දැනුම පරීක්ෂා කිරීම (කාලය - පැය 01)

03. තවද, අදාල නිලධාරීන් වෙතින් ඇමුණුම 02හි සඳහන් අයදුම්පත්‍රය සම්පූර්ණ කර (මෙම පරීක්ෂණය සඳහා දෙවන වර පෙනී සිටින නිලධාරීන් විසින් නියමිත විභාග ගාස්තු ගෙවා ලදුපත අයදුම් පත්‍රයේ නියමිත ස්ථානයේ අලවා තිබිය යුතුය) ඔබගේ නිර්දේශය ද සමඟ 2026.08.21 දිනට පෙර ප්‍රධාන කාර්යාලය වෙත ලැබීමට සලස්වන ලෙස දන්වන අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් භාර ගනු නොලබන බව වැඩිදුරටත් දන්වමි.

එච්.පී.චන්ද්‍රලාල්
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් (පාලන)
රෙජිස්ට්‍රාර් ජනරාල් වෙනුවට

දුරකථන - 0112072038
ෆැක්ස් - 0112889493
විද්‍යුත් තැපැල - admin@rgd.gov.lk